# අද ඇරඹෙන නවකතාව









## ජගත් ජේ එදිරිසිංහ ලියන නවකතාව

### පළමු කොටස

විදුල මේසයට හිස තබාගත්වනම නින්දට වැටී ඇති සැටි කාමරයට හිස පොවා බැලූ නිරාෂා දුටුවා ය. තමා පැයකට පමණ පෙර සාදා දුන් තේ කෝප්පයද මේසයේ කෙළවරක නිවෙමින් තිබෙණු ඇයට පෙනුණි. එය බොන්නට ඔහුට අමතක වන්නට ඇත. ඔහු හිස තබා ගෙන සිටින්නේ ලියමින් සිටි තිර නාටක පිටපත මත බව තේ කෝප්පය අතට ගන්නා අතර ඕ දුටුවා ය. ගෙතුළට යාමට හැරුණ ඈ මොහොතකට සිය අදහස වෙනස් කර ගත්තා ය.

"ඇඳට ගිහින් නිදාගන්න.." ඔහුගේ අවුල් ව ගිය හිස කෙස් මත සිය දකුණත තැබූ ඈ පහත් හඬින් කීවා ය.

ඔහු අපහසුවෙන් හිස ඔසවා නිදිමතින් අඩවන්ව ගිය ඇසින් ඇය දෙස බැලුවේ ය.

"ඇඳට ගිහින් නිදාගන්න.." ඈ නැවත කීවා ය.

"දන්නෙම නැතුව නින්ද ගියා.." ඔහු සිනා-සෙන්නට උත්සාහ කරමින් කීවේ ය. "..වෙලාව කීය ද..?"

"දොළහ පහුවුණා..."

"මට තව ටිකක් වෙලා වැඩ කරන්න ඕනෙ.. ඔයා ගිහින් නිදා ගන්න" ඔහු කතා කරන අතරදී ම දුම්වැටියක් දල්වා ගත්තේ ය. "..නිවුණාට කමක් නැහැ.. තේ එක තියල යන්න.. මං බොන්නං.."

"නෑ මං අලුත් එකක් හදල ගෙනත් දෙන්නං.." ඈ කාමරයෙන් පිටව යන අතර කීවා ය.

දුම් උගුරු කීපයක් තදින් උරාගත් විදුල